# 2.44 මෙතෙක් අස්ථානගතව පැවති පැරණිතම කෝලම් කවි සංගෘහිත වර්ෂ 1895 දී ඒ.ජේ.ප්‍රේරා විසින් සංස්කරණය කරන ලද කෝලම් කවි පොත පිළිබඳ සන්නිවේදන විග්‍රහයක්

අරුණ ලොකුලියන
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

ශ්‍රී ලංකාවේ දකුණු පලාත තුළ අම්බලන්ගොඩ බෙන්තර සහ මිරිස්ස ආශ්‍රිතව පැතිර පවතින කෝලම් ගැමි නාටක වෙසෙසක් සේ හැඳින්විය හැකිය. දකුණු ඉන්දියානු භාෂා අතර කෝලම් යන වචනය පැවතියත් ලංකාවේ අදටත් ශේෂ වී පවත්නා කෝලම් යනු ශ්‍රී ලංකාවටම ස්වීය ජන නාටකයකි.

සියවස් දෙකක් හෝ ඊට මදක් ඉහත කාලයකදී ශ්‍රී ලාංකීය කෝලම් ජන නාට්‍යය ප්‍රභවය වී යැයි නිගමනය කිරීමට ප්‍රමාණවත් ලිඛිත මූලාශ්‍ර දේශීය හා විදේශීය පර්යේෂකයින් සහ ලේඛකයින් ගේ ලේඛන ඇසුරින් සපයා ගත හැකිය. ඒ අතර කෝලම් පිළිබඳ ලියැවුණු ප්‍රධාන ඓතිහාසික ලිඛිත මූලාශ්‍ර පහක් පිළිබඳ සඳහන් වේ. එනම්,

01. වර්ෂ 1829 දී ජෝන් කැලවේ නම් පූජකතැන විසින් ප්‍රකාශිත Yakkun Nattanawa Nattanawa and Kolan Nattaíwa නම් පිටපත

02. වර්ෂ 1898 දී රචිත කොළඹ කෞතුකාගාර පුස්තකාලයේ ඇති AC 14 හා 7/K-5 දරණ පුස්කොල පිටපත්

03. වර්ෂ 1895 දී බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති OR4995 දරණ පුස්කොළ පිටපත

04. වර්ෂ 1895 දී විසින් සංස්කරණය කර මුද්‍රණය කරන ලද කෝලම් කවි පොත නම් කෝලම් කාව්‍ය සංග්‍රහය

05. වර්ෂ 1930 දී මහාචාර්ය ඔටාකර් පර්ටෝල්ඩ් විසින් රචිත The Ceremonial Dances of the Sinhalese නම් ලිපිය

මෙයින් වඩාත්ම පැරණි මුද්‍රිත පිටපත ලෙස සැලකිය හැකි වන්නේ වර්ෂ 1895 දී ඒ.ජේ ප්‍රේරා (A.J. Perera) නම් අය සංස්කරණය කළ කෝලම් කවි පොතයි. මේ පිළිබඳ මුල්වරට සඳහන් වී ඇත්තේ වර්ෂ 1952 දී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ The Sinhalese Folk Play නම් කෘතියේයි. කොළඹ කෞතුකාගාරයේ තිබූ ඉහත කී මුද්‍රිත පිටපත ගැන එහි සඳහන් වුවත් ඉන්පසුව ඒ පිළිබඳ සඳහනක් කිසිඳු මූලාශ්‍රයක හමු නොවේ. වර්ෂ 1986 දී මහාචාර්ය තිස්ස කාරියවසම් විසින් රචිත මනමේ කෝලම නම් කෘතියේද ඉහත කී මුද්‍රිත පිටපත සොයාගත නොහැකි බව සඳහන් වෙයි.

ඉතා දුර්ලභ මෙම කෘතියේ පිටපතක් වර්ෂ 2000.06.20 වන දින කැලණිය විශ්වවිද්‍යාලයේ විමර්ශන පුස්තකාලයේ තිබී මා වෙත හමු විය. ඉතා දුර්වලව දිරා ගිය කුඩා පොත් පිංචක් ලෙස පැවති එය මවිසින් පුස්තකාලයේ දුර්ලභ අංශයට යොමු කළෙමි.

පැරණිම සිංහල මුද්‍රිත අකුරින් මුද්‍රිත එය කෝලම් කවි 267 කින් සමන්විත මෙතෙක් ශ්‍රී ලංකාවේ හමු වී ඇති පැරණිතම මුද්‍රිත කෝලම් කවි පොත ලෙස හැඳින්විය හැකිය. එසේම සිංහලයෙකු අතින් සංස්කරණය වූ වඩාත් විශ්වසනීය පැරණිතම කෝලම් කාව්‍ය සංග්‍රහය ලෙස එය සැලකිය හැකිය.

එකී දුර්ලභ කෝලම් පිටපත තුළින් හෙළිවන කෝලම් ජන නාටකයේ ස්වරූපය පිළිබඳ තුලනාත්මක විග්‍රහයක් මෙමගින් ඉදිරිපත් වෙයි.